**මහර ප්‍රාදේශීය සභාව**

**ගම්පහ දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මහර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ග්‍රාමීය යටිතල පහසුකම් ව්‍යාපෘතියකට සමාලෝචිත වර්ෂයේ ගෙවීම්කර තිබූ රු.86,769 ක මුදලක් මූල්‍ය ප්‍රකාශන වල ණයහිමි ලෙස වෙන්කර තිබුණි.

(ආ) යටිතල පහසුකම් ව්‍යාපෘති 03 ක සියයට 10 රඳවුම් මුදල වූ රු.91,247 ක් ගිණුම් වල වගකීමක් වශයෙන් ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) පිඹුරු අංක 13085 A දරන සැලැස්මට අදාල ඉඩම සහ ගොඩනැගිල්ලෙහි වටිනාකම වූ රු.1,715,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂය තුල සභා අරමුදල් යටතේ සිදුකරන ලද ඉදිකිරීම් 06 ක වටිනාකම වූ රු.3,329,166 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) සභාවට හිමිකම් ඔප්පු මගින් ලබාදී තිබුණ පොදු පහසුකම් ඉඩම් 4 ක වටිනාකම වූ රු.43,164,400 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් වී ඇති උඩුපිල මූකලාන ඇලවත්ත ඉඩමෙහි වටිනාකම වූ රු.2,240,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ඉඩම් හා ගොඩනැගිලි 15 ක වටිනාකම වූ රු.17,749,248 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත්කර නොතිබුණි.

(ඌ) අයවිය යුතු රු.19,890 ක් වූ හිඟ බලපත්‍ර ගාස්තු ගිණුම්වල ඇතුලත් කර නොතිබුණි.

(එ) සතොක්ෂණ වාර්තා අනුව පොදු ගබඩා තොගය රු.3,529,624 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන වලට තොග පාලන ගිණුමේ ශේෂය වූ රු.6,334,200 ක වටිනාකම ඇතුලත්කර තිබුණි.

1.3.2 <u>නොසැසඳුණු ගිණුම්</u>

මූලා ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 03 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.38,082,073 ක වෙනසක් තිබුණි.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

(අ) <u>ලැබිය යුතු ගිණුම්</u>

2017 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය වූ රු.213,059,830 ක් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකෙරුණි.

(ආ) <u>ගෙවිය යුතු ගිණුම්</u>

2017 දෙසැම්බර් 31 දිනට පැවති ගබඩා ණයහිමි ශේෂය වූ රු.9,968,592 තුල වර්ෂ 02 ත් 03 ත් අතර ශේෂය රු.2,216,964 ක් හා වර්ෂ 03 ට වැඩි ශේෂය රු.1,031,756 ක් විය.

1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම්</u>

<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

අයිතිය ලිඛිත සාක්ෂි මගින් සනාථ නොකළ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.3,378,870 ක් විය.

1.3.5 <u>අනුකූල නොවීම්</u>

<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූලා හා පරිපාලන) රීති 203 | සභාවේ දේපල පිළිබඳව පූර්ණ සමීක්ෂණයක් කර වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ | |
| | (i) මුදල් රෙගුලාසි 396 (ඈ) | නිකුත්කර මාස 06 ඉක්මවන ලද රු.74,048 ක් වටිනා චෙක්පත් 44 ක් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 ඉක්මවූ පොදු තැන්පත් රු.4,962,189 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,269,237 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.54,838,586 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 10,163,000 | 12,980,012 | 9,451,933 | 3,961,900 | 8,900,000 | 10,175,668 | 10,175,668 | 5,943,761 |
| (ii) | කුලී | 6,573,000 | 6,580,613 | 6,580,613 | (1,934,964) | 6,023,000 | 6,155,117 | 6,155,117 | (1,360,090) |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,461,100 | 1,733,522 | 1,733,522 | (236,664) | 2,637,000 | 1,976,639 | 1,976,639 | 32,426 |
| (iv) | වෙනත් ආදායම් | 260,677,000 | 220,430,096 | 220,430,096 | 560,985 | 245,793,000 | 213,047,008 | 213,047,008 | - |
| | | 279,874,100 | 241,724,243 | 238,196,165 | 2,351,256 | 263,353,000 | 231,354,432 | 231,354,432 | 4,616,097 |

#### 2.2.2 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම අනුව රු.3,934,760 ක හිඟ වරිපනම් ශේෂයක් දක්වා තිබුණ ද සභාව විසින් ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන අනුව රු.9,471,840 ක හිඟ ශේෂයක් පෙන්නුම් කෙරුණි. මෙම වෙනසට හේතු වූ කරුණු සභාව විසින් පැහැදිලි නොකෙරුණි.

#### 2.2.3 වෙනත් ආදායම්

**ප්‍රචාරණ දැන්වීම්**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 28 දිනැති අංක 1947/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය ප්‍රකාර ප්‍රචාරණ දැන්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ප්‍රචාරණ දැන්වීම් පුවරු 66 ක් සඳහා ගාස්තු රු.114,633 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 28 දිනැති අංක 1947/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ඇතුලත් අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව අයදුම්පත්‍ර සකස්කර නොතිබුණි.

#### 2.2.4 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.3,976,150 ක් විය.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1. **<u>කාර්ය සාධනය</u>**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **<u>අතුරු ව්‍යවස්ථා</u>**

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 18 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) **<u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) **<u>අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම</u>**

ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ කර්තව්‍යක් ඉටුකිරීම සඳහා රු.19,300,000 ක ඇස්තමේන්තුගත මුදලකින් රු.13,334,938 ක් වැයකර තිබුන ද අපේක්ෂිත නිමවුම් මට්ටම අත්පත් කරගෙන නොතිබුණි.

(ඈ) **<u>අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම්</u>**

ඉකුත් වර්ෂයන් තුලදී වැඩ නිමකර තිබූ ප්‍රජා ශාලා 04 කින් 2018 ජුනි 29 දින වනවිටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන තිබුණි.

(ඉ) **<u>ඉටු නොකළ කර්තව්‍යයන්</u>**

2017 අයවැය ලේඛනය මගින් කසළ කළමනාකරණය සඳහා කොම්පෝස්ට් අංගනයක් ඉදිකිරීමට සුදුසු ඉඩමක් මිලදී ගැනීම සඳහා රු. මිලියනයක් වෙන්කර තිබුණද වර්ෂය තුල උක්ත කාර්යය ඉටුකරගෙන නොතිබුණි.

(ඊ) **<u>තිරසර සංවර්ධන ඉලක්ක</u>**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 ජුනි 29 දින වන විටත් සකස්කර නොතිබුණි.

3.2 **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

(අ) ප්‍රාදේශීය සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යාලයේ මහජන පැමිණිලි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. උපකාර්යාල 03 මගින් පවත්වාගෙන යනු ලබන මහජන පැමිණිලි ලේඛන වලට අනුව 2017 වර්ෂයේ ලැබුණු මහජන පැමිණිලි 1035 කින් පැමිණිලි 451 ක් පමණ 2018 ජූලි 06 දින වන විටත් විසඳා නොතිබුණි.

**(ආ) <u>නෙක්ෆා පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීම</u>**

ප්‍රාදේශීය සභාව විසින් කාර්යාල කටයුතු කළමණාකරණය කිරීම සඳහා 2013 ජනවාරි 01 දින නෙක්ෆා ඕස්ට්‍රේලියා පෞද්ගලික ආයතනය සමග ගිවිසුම්ගතව වරිපනම් බදු , විවිධ ආදායම්, ගිණුම් කටයුතු, තොග පාලනය, වීදි පහන් සහ වැටුප් යන ක්ෂේත්‍ර කළමනාකරණ මෘදුකාංග පද්ධතිය මිලදී ගැනීම සඳහා රු. 1,796,000 ක් වැයකර තිබුණි. මෙම මෘදුකාංග පද්ධතිය මිලදීගැනීමේ මූලික අරමුණ වූ ක්ෂේත්‍ර 06 ක දත්ත රැස්කිරීම හා කළමනාකරණ කටයුතු සිදුකිරීම වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කර තිබුනේ වරිපනම් ආදායම් කළමනාකරණය පමණි.

3.3 **<u>මානව සම්පත් කළමනාකරණය</u>**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 04 | 04 | - | - |
| තෘතීයික | 01 | 01 | - | - |
| ද්විතියික | 52 | 48 | 04 | 02 |
| ප්‍රාථමික | 96 | 93 | 03 | - |
| | 153 | 146 | 07 | 02 |

ආදායම් පරීක්ෂක තනතුරක් 2015 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුනි.

3.4 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

(අ) **<u>පරිසර බලපත්‍ර</u>**

පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර ස්ථාන 197 ක් ලෙස හඳුනාගෙන තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දිනට පරිසර බලපත්‍ර ලබාදී තිබුණේ ව්‍යාපාර ස්ථාන 51 කට පමණි.

(ආ) **<u>ඉඩම් විකුණුම් මත බදු</u>**

සභා බල ප්‍රදේශය තුල කට්ටි කර විකුණන ලද ඉඩම් සම්බන්ධයෙන් විකුණුම් මිල මත අයවිය යුතු 1% ක ආදායම අයකිරීමේදී ආදායම් අංශයේ නිලධාරියෙකුගේ තක්සේරු මිල පදනම් කරගෙන මුදල් අයකරගෙන තිබුණි. නමුත් මෙම ඉඩම් වල සත්‍ය විකුණුම් මිල පදනම් කරගෙන බදු මුදල් අයකරගෙන නොතිබුණි.

3.5 **<u>වත්කම් කළමනාකරණය</u>**

3.5.1 **<u>වත්කම් ලේඛනගත නොකිරීම.</u>**

ගබඩාව වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ගබඩා තොග ලේඛනය විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. ගබඩාවෙන් ප්‍රධාන කාර්යාලයට නිකුත් කරන ලද භාණ්ඩ තොගයක් ගබඩා තොග ලේඛනයෙන් ඉවත් කර නොතිබූ අතර මේ හේතුවෙන් 2018 ජූලි 04 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී ගබඩා තොගයේ නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය.

3.5.2 **<u>පවරා නොගත් වත්කම්</u>**

2015 වර්ෂය තුල පරිත්‍යාග ලෙස සභාවට ලැබී තිබූ රු.33,877,530 ක් වටිනා මෝටර් රථ 03 ක් පවරාගෙන නොතිබුණි.

3.5.3 **<u>වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය</u>**

2017 දෙසැම්බර් 31 දිනට පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව රු.64,911 ක් වටිනා පොත් 413 ක් අස්ථානගතවී තිබුණි.

3.6 **<u>ප්‍රසම්පාදනය</u>**

**<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

(අ) ඌරුවල් පේරුව උප කාර්යාලයට අයත් පොදු ඉඩම් 06 ක කම්බි වැටවල් සැකසීම වෙනුවෙන් රු.821,049 ක් ගෙවීම් කර තිබූ මේ සඳහා පිරිවැය ඇස්තමේන්තු පිළියෙලකර නොතිබුණි. තවද, මිල ගණන් කැඳවීමක් කර නොතිබූ අතර 2016 දෙසැම්බර් 30 දිනැති මිල කමිටු තීරණයක මිල ගණන් පදනම් කර ගනිමින් දික් අඩියකට රු.578 බැගින් ගෙවීම් කර තිබුණි. මෙම දික් අඩියක උස හෝ කම්බි පොටවල් ගණන පිළිබඳව නිශ්චිතව දක්වා නොතිබුණි.

(ආ) මාර්ග කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්ත 10 කට අදාලව රු.3,739,511 ක් ගෙවීම් කිරීමේදී එම කර්මාන්ත වලට අදාල ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් කොන්ක්‍රීට් ස්ථරයේ ඝණකම සහ සම්පීඩන ශක්තිය පිළිබඳව රසායනාගාර පරීක්ෂාවකින් තහවුරු කරගැනීමකින් තොරව ගෙවීම් සිදුකර තිබුණි.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

4.1 **<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද වැය ශීර්ෂයන් 21 කට අදාලව රු.7,786,200 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබීම හා වැය විෂයයන් 34 කට අදාලව රු.41,581,372 කින් 20% සිට 99% දක්වා ඉතිරිව තිබීම හේතුවෙන් සභාවේ අරමුණු සහ පරමාර්ථ ඉටුකිරීම සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය නොවීය.

5. **<u>පද්ධති හා පාලනය</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) | වරිපනම් හා කඩකුලී තක්සේරු නොකිරීම |
| | | (ii) | හිඟ ආදායම් එකතුකිරීම දුර්වල තත්ත්වයක පැවතීම |
| | | (iii) | ඌන උපයෝජිත කඩකාමර නැවත ටෙන්ඩර් ලබා නොදීම |
| | | (iv) | වරිපනම් බදු ප්‍රතිශත සංශෝධනය නොකිරීම |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත් පරිපාලනය | (i) | අධීක්ෂණ කටයුතු දුර්වල තතත්වයක පැවතීම |
| (ඇ) | අයවැය පාලනය | (i) | ප්‍රායෝගික තත්ත්වයන්ට අනුකූල වන පරිදි අයවැය සකස් නොකිරීම. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | (i) | භෞතිකව නොමැති වත්කම් ගිණුම් වලින් ඉවත් නොකිරීම |
| | | (ii) | වත්කම් වල අයිතිය තහවුරු කිරීමට ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා නොගැනීම |
| | | (iii) | ස්ථාවර වත්කම් ගිණුම් තැබීමේ ප්‍රතිපත්තියක් ඇතිකර නොගැනීම |
| | | (iv) | ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා නොගැනීම |
| | | (v) | වාර්ෂිකව වත්කම් සමීක්ෂණය නොකිරිම |
| (ඉ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | කසළ බද්දු අය නොකිරිම |
| | | (ii) | කසළ වෙන්කර ලබාදීමට ජනතාව දැනුවත් නොකිරිම |
| | | (iii) | කසළ බැහැර කිරීම සඳහා යන වියදම් අවම කර නොගැනීම |